᪴ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2203/16 - 2020 නොවැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2020.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත් කරමි; එනම් -

1. ඉහත කී පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගෙන ඇත්තා වූ කොළඹ වරාය නගරයේ සිරස් නිරූපක කුළුණු පහක් සහිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් වන කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා වන ව්‍යාපෘතියක් පිළිබඳ තොරතුරු අන්තර්ගත නිවේදනය 2020 ජූලි මස 15 වැනි දින අංක 2184/15 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීය.

2. කොළඹ වරාය නගරයේ පළමු සිරස් නිරූපක කුළුණු පහක් සහිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් වන කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා වන ව්‍යාපෘතිය ඉහත කී පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගැනීම සඳහා ද, එකී පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව එම ව්‍යාපෘතිය සඳහා බදු නිදහස් කිරීම් ප්‍රදානය කිරීම සඳහා ද 2020 ඔක්තෝබර් මස 26 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

3. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියේ නම ''කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය (CIFC) මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය'' ("ව්‍යාපෘතිය") විය යුතු ය.

4. ව්‍යාපෘති පහත දැක්වෙන ආකාරයට අදියර දෙකකින් (02) ක්‍රියාත්මක විය යුතුය :

   01 වන අදියර :

   මෙම අදියර ජාත්‍යන්තර A ශ්‍රේණියේ මහල් සමූහයකින් යුත් නවීන කාර්යාල කුළුණක්, උසස් ස්ථරයේ නිවාස කුළුණු දෙකක් සහ සිල්ලර වෙළෙඳ පීඨිකාවකින් සමන්විත වේ.

1A - PG 5172 — 570 (2020/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**02 වන අදියර :**

මෙම අදියර ජාත්‍යන්තර A ශ්‍රේණියේ මහල් සමූහයකින් යුත් නවීන කාර්යාල කුළුණක් සහ සිල්ලර වෙළෙඳ පීඨිකාවකින් සමන්විත වේ.

5. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි ("ව්‍යාපෘති සමාගම") ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම භාරගැනීමේ කාර්ය සඳහා සංස්ථාපනය කිරීමට නියමිත සමාගම අතර ව්‍යාපෘති ගිවිසුමට ඇතුළත් වූ දින සිට ආරම්භව මාස අනූහයක (96) කාලසීමාවක් ඇතුළත මෙම ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය. ඉහත කී ව්‍යාපෘති ගිවිසුම් දිනයේ සිට මාස හතළිස් අටක (48) කාලසීමාවක් ඇතුළත ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපෘතියේ 01 වන අදියර සම්පූර්ණ කරනු ලැබිය යුතු අතර 01 වන අදියර සම්පූර්ණ කිරීමේ දින සිට මාස හතළිස් අටක (48) කාලසීමාවක් ඇතුළත ව්‍යාපෘති සමාගම විසින් හෝ අවසරලත් පැවරුම්ලාභියකු සමගින් ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපෘතියේ 02 වන අදියර සම්පූර්ණ කරනු ලැබිය යුතුය. ("ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව")

6. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ආකාරයට, මෙම නියමයේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පැනවීම්වල සඳහන් වන විධිවිධාන අදාළ වීමෙන් ව්‍යාපෘතිය නිදහස්වන අතර එම විධිවිධාන එහි නිශ්චිතව දක්වා ඇති සීමා කිරීම්වලට යටත්ව ව්‍යාපෘති සමාගමට සහ/හෝ එහි අවසරලත් පැවරුම්ලාභියාට අදාළ වන අතර එම විධිවිධාන මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා බලාත්මකව පවතින්නේ ය.

**උපලේඛනය**

**(1) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**
**සංස්ථාපිත ආදායම් බද්ද**

**"බදු නිදහස් කාලසීමාව"**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට තක්සේරු වර්ෂයේ සිට උපචිත වන ලාභ හා ආදායම් මත ආදායම් බදු පැනවීමට අදළ 2017 අංක 24 දරන දේශීය ආදයම් පනතේ විධිවිධාන;

(i) මහල් නිවාස විකිණීම හැර අනෙකුත් අනුමත කරන ලද ක්‍රියාකාරකම් වසර පහළවක (15)ක කාලසීමාවක් සඳහා අදාළ නොවේ.

(ii) මහල් නිවාස විකිණීම වසර හයක (06) කාලසීමාවක් සඳහා අදාළ නොවේ.

ව්‍යාපෘති සමාගමේ සමස්ථ ක්‍රියාකාරකම් සඳහා වූ ඉහත කී බදු නිදහස් කාලසීමාව ව්‍යාපෘති සමාගම විසින් බදු අයකළ හැකි ලාභ උපයන වර්ෂයේ සිට හෝ ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ වීමෙන් පසු අවුරුදු තුනක කාලසීමාවක් ඇතුළත යන අවස්ථා දෙකෙන් කලින් එළඹෙන අවස්ථාවේ සිට ආරම්භ වේ.

**"බදු සහන කාලසීමාව"**

බදු නිදහස් කාලසීමාව අවසන් වීමෙන් පසුව, වර්ෂයකට සියයට හතක (7%) සහන බදු අනුපාතිකය හෝ සංචාරක අංශය සඳහා අදාළ වන ආයතනික බදු අනුපාතිකයෙන් සියයට පනහකට (50%) සමාන අනුප්‍රමාණයක්, මහල් නිවාස විකිණීම හැර, අනෙකුත් අනුමත ක්‍රියාකාරකම් තුළින් උපචිත වන ලාභ හා ආදායම මත වසර දහයක (10) කාලසීමාවක් සඳහා අදාළ විය යුතු ය.

මහල් නිවාස විකිණීමෙන් උපචිත වන ලාභ හා ආදායම සඳහා, අවුරුදු හයක (06) බදු විරාම කාලසීමාව අවසන් වීමෙන් පසුව, එදිනට බලපවත්නා ආයතන ආදයම් බද්ද අදාළ වේ.

සැක දුරු කිරීමේ කාර්යය සඳහා, ඉහත කී බදු නිදහස් කාලසීමාව සහ සහන කාලසීමාව අවසන් වීමෙන් පසුව, ව්‍යාපෘති සමාගමේ ලාභය සහ ආදායම සම්බන්ධයෙන් වූ ආදායම් බද්ද තත්කාලයේ බලපවත්නා දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ විය යුතු ය.

**ලාභාංශ බද්ද**

බදු නිදහස් කාලසීමාවේදී උපයන ලාභයෙන් කොටස් හිමියන් අතර බෙදී යන ලාභාංශ, අවුරුදු පහළවක (15) එකී බදු නිදහස් කාලසීමාව තුළ දී සහ ඉන් පසුව එක් අවුරුද්දක (01) කාලසීමාවක් සඳහා ආදායම් බදු ගෙවීමෙන් නිදහස් වේ.

**රඳවුම් බද්ද**

පහත සඳහන් කරුණු මත අය කරනු ලබන රඳවුම් බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් කළ යුතුය;

(අ) කළමනාකරණ ගාස්තු සහ රාජ්‍යභාග ගෙවීම් මත, ඉහත කී රඳවුම් බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන නමුත් එකී ගාස්තුවල සම්පූර්ණ ප්‍රමාණය දළ මෙහෙයුම් ආදායමෙන් සියයට තුනක් (3%) නොඉක්මවිය යුතුය;

(ආ) අලෙවිකරණ ගාස්තු මත ඉහත කී රඳවුම් බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන නමුත් එම ගාස්තුවල සම්පූර්ණ ප්‍රමාණය දළ මෙහෙයුම් ආදායමෙන් සියයට එකයි දශම පහක් (1.5%) නොඉක්මවිය යුතුය;

(ඇ) දිරි දීමනා කළමනාකරණ ගාස්තු මත ඉහත කී රඳවුම් බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස්වන නමුත් එම ගාස්තුවල සම්පූර්ණ ප්‍රමාණය දළ මෙහෙයුම් ආදායමෙන් සියයට දහයක් (10%) නොඉක්මවිය යුතුය;

(ඈ) විදේශ ණය මත පොළිය සඳහා සහ ප්‍රාග්ධන වියදම් සඳහා ගනු ලබන ණය මත මෙන්ම තාක්ෂණික ගාස්තු මත ඉහත කී රඳවුම් බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වේ.

**උපයන විට බද්ද/පුද්ගල ආදායම් බද්ද**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලසීමාව තුළ දී, යම් දෙන ලද අවස්ථාවක දී උපරිම වශයෙන් විදේශීය කාර්ය මණ්ඩල සාමාජිකයන් තිහක (30) ප්‍රමාණයක් සඳහා අදාළවන උපයන විට බදු (PAYE) පුද්ගල ආදායම් බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් විය යුතුය.

තව ද, ව්‍යාපෘති සමාගමේ විදේශීය කාර්ය මණ්ඩලය වෙනුවට නිතරම දේශීය සේවා නියුක්තිකයන් යෙදවීමට ව්‍යාපෘති සමාගම විසින් තම උපරිම උත්සාහය ගනු ලැබිය යුතුය.

පහත දැක්වෙන සීමාවන්ට යටත්ව සේවා නියුක්තිකයන් සේවයේ නියුක්ත කිරීමට ව්‍යාපෘති සමාගම එකඟ වේ.

| | | |
|---|---|---|
| නිපුණතා නොමැති කම්කරු සේවක අවශ්‍යතාවය | - | 75%ක් දේශීය වශයෙන් ලබාගත යුතු වේ. |
| නිපුණතා සහිත කම්කරු සේවක අවශ්‍යතාවය | - | 65%ක් දේශීය වශයෙන් ලබාගත යුතු වේ. |
| ඉහළ තරාතිරමේ සේවකයන් (සුදු කරපටි සේවා) | - | 75%ක් දේශීය වශයෙන් ලබාගත යුතු වේ. (ව්‍යාපෘති සමාගම සඳහා අවසර ලබා දී ඇත්නම්, ඉහළ තරාතිරමේ සේවකයන් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කරනු ලැබිය යුතු වේ.) |

**(2) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු (VAT) පනත**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ආකාරයට, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන, ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම භාණ්ඩ හා සේවා ආනයනය කිරීම් මෙන්ම ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ හෝ සේවා දේශීය වශයෙන් මිලදී ගැනීම්, සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ එකතු කළ අගය මත බදු (වැට් බදු) ගෙවීමෙන් මාස අනූහයක (96) කාලසීමාවක් සඳහා සම්පූර්ණයෙන්ම නිදහස් කරනු ලැබිය යුතු වේ.

ව්‍යාපෘති සමාගම/ව්‍යාපෘතිය සඳහා සෘජුවම කරනු ලබන සැපයුම් සඳහා පමණක් නොව 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ නියම කර ඇති සහ අවසර ලබාදී ඇති ආකාරයට ව්‍යාපෘති සමාගම/ව්‍යාපෘතිය වෙත සැපයීම් ලබාදීම සඳහා උපකොන්ත්‍රාත්කරුවකු විසින් කොන්ත්‍රාත්කරුවකු වෙත ලබාදෙන සැපයුම් සඳහා ද වැට් බදු ගෙවීම් නිදහස් කිරීම අදාළ විය යුතුය.

වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමත් සමග, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ අර්ථ නිරූපණය කර ඇති ආකාරයට, සැපයුම් වටිනාකම මත වැට් බදු ගෙවීම සඳහා ව්‍යාපෘති සමාගම යටත් වන්නේය.

**(3) රේගු ආඥාපනත (235 වන අධිකාරය)**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාස අනූහයක (96) කාලසීමාව තුළදී ව්‍යාපෘතියේ කාර්යය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සියලුම ඉදිකිරීම් ආශ්‍රිත අයිතම ආනයනය කිරීම් රේගු බදු ගෙවීමෙන් නිදහස් වේ.

ව්‍යාපෘති සමාගම විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිතව සෘජුවම ආනයනය කරනු ලබන හෝ කොන්ත්‍රාත්කරුවන් හරහා සපයා ගනු ලබන, ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන සියලුම ඉදිකිරීම් ආශ්‍රිත අයිතම ආනයනය කිරීම්, ව්‍යාපෘති සමාගමේ නමින් ගෙන්වා ඇත්නම් පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාස අනූහයක (96) කාලසීමාව සඳහා ව්‍යාපෘති කාර්යය සඳහා රේගු බදු ගෙවීමෙන් නිදහස් විය යුතුය.

නිශේධන ලැයිස්තුවේ පවතින අයිතම ශ්‍රී ලංකාවේ සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කරනු නොලබයි නම් හෝ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් තත්ත්වයෙන්, ප්‍රමාණයෙන් සහ අවශ්‍ය කාලසීමා තුළදී ලබාගත නොහැකි වේ නම් මිස, එම නිශේධන ලයිස්තුවේ පවතින අයිතම බදු ගෙවීමෙන් තොරව ආනයනය කිරීම සඳහා අවසර දෙනු නොලැබේ.

ඒ අනුව පොදුවේ ගත්කල, ව්‍යාපෘති සමාගම එම භාණ්ඩ ලබාගන්නා වශයෙන් නම්කර ඇත්නම් පමණක්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාස අනූහයක (96) කාලසීමාව ඇතුළත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවකු හෝ උපකොන්ත්‍රාත්කරුවකු හරහා ඉදිකිරීම් ආශ්‍රිත භාණ්ඩ ආනයනය කරනු ලැබිය හැකි ය. ඒ අනුව, වෙනත් ආනයනයන් සමග මෙම ව්‍යාපෘතියට අදාළ ආනයන සිදුකර ඇත්නම්, මෙහි සඳහන් සහන ව්‍යාපෘති සමාගමේ ඉදිකිරීම් ආශ්‍රිත භාණ්ඩ සඳහා පමණක් පවතින බවට සහතික කිරීම සඳහා ව්‍යාපෘති සමාගම විසින් පරම වශයෙන් වගකිව යුතු අතර, ඒ අනුව යම් හේතුවක් නිසා මෙම කොන්දේසිය උල්ලංඝනය කර ඇති අවස්ථාවකදී, තත්කාලයේ බලපවත්නා නීති සහ නියෝග යටතේ ගෙවිය යුතු බදු සහ අයකිරීම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආශ්‍රිත භාණ්ඩවල කොටසක් නොවන සියලුම භාණ්ඩ සඳහා අදාළ විය යුතු අතර එම බදු වහාම ගෙවීමට නියමිත වේ. ව්‍යාපෘති සමාගමේ සේවා නියුක්තිකයකුගේ, උපදේශකවරයකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ පුද්ගලික/පුද්ගල භාවිතය සඳහා ව්‍යාපෘති සමාගම විසින් ආනයනය කරනු ලබන පුද්ගලික අයිතම ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ලෙස සලකනු නොලැබිය යුතු බව සැළකිය යුතු වේ.

**(4) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාස අනූහයක (96) කාලසීමාව තුළදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා (ව්‍යාපෘති සමාගම විසින් සෘජුවම ආනයනය කරනු ලබන හෝ කොන්ත්‍රාත්කරුවන් හරහා සපයාගනු ලබන) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සියලුම අයිතම මත වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද (PAL) ගෙවීමෙන් සහ අය කිරීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් කරනු ලැබිය යුතු ය.

**(5) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාස අනූහයක (96) කාලසීමාව තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත අයිතම ආනයනය කිරීම් සෙස් බදු (CESS)ගෙවීමෙන් නිදහස් විය යුතු ය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

12 - 273

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.